## ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගය 2025 (2026) - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

## රැගෙන ආ යුතු ලේඛන

i. ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ii. 2025.11.24 දිනට පූර්වාසන්න වර්ෂ හයක (06) කාල සීමාවක් ඇතුළත අයදුම්කල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර තුනක කාල සීමාවක් (03) අඛණ්ඩව ස්ථිරව පදිංචිව සිටිය යුතු අතර එය සනාථ කිරීම සඳහා,
   a. ඡන්දහිමි නාමලේඛනයේ උද්ධෘත හෝ
   b. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය (DS 04) රැගෙන ආ යුතුය.

iii. උප්පැන්න සහතිකය,

iv. අංක 2460 හා 2025.10.24 දිනැති ගැසට් පත්‍රයේ පල කර ඇති ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ නිවේදනය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුව මූලික අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය වන ලිපි ලේඛනවල මුල් පිටපත් රැගෙන ආ යුතුය. **(අධ්‍යාපන සහතික හා කුසලතා සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම සහතිකවල පිටපත් ඔබ විසින් සත්‍ය පිටපත් බව සහතික කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.)**

v. නමෙහි වෙනසක් ඇත්නම් දිව්රුම් ප්‍රකාශයක් මගින් එය තහවුරු කල යුතුය.